සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# ඉස්ලාම් ධර්මය

**8 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

**නම/ විභාග අංකයඃ**

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **ඉතා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 අල්කුර්ආනය අතිශය ලෙස ලබාදෙන ලද නබිවරයා

(i) ඊසා (අලෛ) (ii) මූසා (අලෛ) (iii) සීදු (අලෛ) (iv) මුහම්මද් (සල්)

02 ''නබිවරයාණනි ! නියතවශයෙන්ම ඔබ යහපත් ගතිගුණාංගවලින් යුතුව සිට'' යන වදන

(i) නබි (සල්) වදන වේ. (ii) සහාබා වදන වේ.

(iii) අල්කුර්ආනයේ වදන වේ. (iv) ඉමාම්වරයෙකුගේ වදන වේ.

03 පහත කරුණුවලින් යහගුණාංගයක් නොවන කරුණ

(i) ලැජ්ජාව (ii) කීකරුවීම (iii) ඉවසීම (iv) බොරු කීම

04 නබි (සල්) තුමාණන්ගේ මුණුබුරෙක් වන්නේ,

(i) හසන් (රලි) (ii) අනස් (රලි) (iii) උසාමා (රලි) (iv) සෙයිද් (රලි)

05 ඉන්ජිල් ආගම් කෘතිය පහළ වූ නබිවරයාණන් වන්නේ,

(i) මූසා (අලෛ) (ii) ඊසා (අලෛ) (iii) දාවූද් (අලෛ) (iv) නුහ් (අලෛ)

- **පහත සඳහන් කරුණු නිවැරදි නම් (✓) යනුවෙන් ද, වැරදි නම් (×) යනුවෙන්ද සඳහන් කරන්න.**

06 පොළොවේ ගමන් කිරීමට අල්කුර්ආනය පොළොඹවයි. ( )

07 අල්කුර්ආනය එය පාරායනය කළ අයට පරලොව දිනයේ ආයාචනා කරයි. ( )

08 සූරා මාඌන් කුර්ආනයේ 107 වැනි පරිච්ඡේදයයි. ( )

09 හදීස් කුද්සි ඉස්ලාම්හි තුන්වන මූලාශ්‍රය වේ. ( )

10 ස්තුති කිරීම සඳහා කරන සුජූදය ''සජ්දා තිලාවත්'' වේ. ( )

- **ගැලපෙන වචනය යා කරන්න.**

11 අනාථයා * 114

12 අල් මාඌන් * යතීම්

13 අල් අමීන් * 15

14 සජ්දාවන් * වටිනාකමක් නැති දේ

15 අල්කුර්ආනයේ සූරාවන් * විශ්වාසවන්තයින්

- **සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.**
  (මහා පාපයක් / ආමන්ත්‍රණය කිරීම / ආදරය / කියවා දෙන ලද වහී / හංගත්වයන් / කියවා නොදෙන ලද වහි / කුඩා පාපයන් වලින්)

16 දුආ යන වචනයේ භාෂාමය අර්ථය ............................................................... වේ.

17 ආදරය නොපෙන්වනු ලබන දරුවන් තුළ ඇතිවන හානීන් වලින් ................................................ එකක් වේ.

18 අනාථ දරුවන් කෙරෙහි කරුණාව දක්වීමෙන් සිතේ .................................................... ඇතිවේ.

19 අනාථයින්ගේ දේපල පරිහරණය කිරීම ............................................................................ එකක් වේ.

20 ''වහී මත්ලු'' යනු ............................................................................ වේ.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) කුඩා දරුවන් වැඩිහිටියන්ගෙන් බලාපොරොත්තු වන කරුණු දෙකක් සඳහන් කරන්න.

(ii) අප වැළකී සිටිය යුතු දුර්ගුණාංග දෙකක් සඳහන් කරන්න.

(iii) අප විසින් අන් අයට කළයුතු උපහාර දෙකක් සඳහන් කරන්න.

(iv) පරලොව දිනයේදී ඉදිරිපත් කරනු ලබන සාක්ෂීන් දෙකක් ලියන්න.

(v) අල්ලාහ් හා මුහම්මද් (සල්) තුමාණන් තහනම් කළ පාප ක්‍රියාවන් දෙකක් සඳහන් කරන්න.

(vi) අල්කුර්ආනය පාරායන කිරීමෙන් ඇතිවෙන ප්‍රයෝජනයන් දෙකක් සඳහන් කරන්න.

(vii) ''අල් මාඌන්'' යනුවෙන් සඳහන් වන දෑට උදාහරණ දෙකක් ලියන්න.

(viii) හදීස්හි ප්‍රධාන කොටස් දෙක සඳහන් කරන්න. (ලකුණු 2 x 8 = 16)

02 (i) අන් අයගේ උදව් උපකාර අවශ්‍ය පිරිස් තුනක් නම් කරන්න.

(ii) සූරා අල් මාඌන් ලබාදෙන පාඩම් හතරක් සඳහන් කරන්න.

(iii) පහත සඳහන් අරාබි වචනයන්වල අර්ථය ලියන්න.

1. මිස්කින් 2. සාහූන් 3. යුරාඌන් 4. මුසල්ලීන්

(ලකුණු 3 + 4 + 4 = 11)

03 (i) ගමනක් යනවිට පිළිපැදිය යුතු කියමන් තුනක් සඳහන් කරන්න.

(ii) පාප ක්‍රියාවලින් ඇතිවන හානීන් හතරක් සඳහන් කරන්න.

(iii) අප පිළිපැදිය යුතු යහගුණාංග හතරක් සඳහන් කරන්න. (ලකුණු 3 + 4 + 4 = 11)

04 (i) අලිම්වරුන් ගෞරවය කරන ක්‍රමයන් තුනක් සඳහන් කරන්න.

(ii) දුආ ප්‍රාර්ථනාවන්හි වැදගත්කම සඳහන් හදීසයක් ලියන්න.

(iii) රාමසාන් මාසයේ අප වැළකී සිටිය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 3 + 4 + 4 = 11)

05 (i) යහගුණාංග පිළිබඳ අල්කුර්ආන් වාක්‍යයක් සඳහන් කරන්න.

(ii) කුඩා දරුවන් කෙරෙහි මුහම්මද් (සල්) තුමා ආදරය කළ ආකාරයන් හතරක් සඳහන් කරන්න.

(iii) අල්කුර්ආනය හා හදීස් කුද්සි අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 3 + 4 + 4 = 11)

06 (i) ''හදීස් කුද්සි'' ''හදීස් නබවි'' වෙනස කුමක් ද?

(ii) සලාතයෙ පරලොව ප්‍රයෝජනයන් හතරක් සඳහන් කරන්න.

(iii) රසුල්වරුන් සිව්දෙනෙක් සඳහන් කර ඔවුන්ට ලබාදෙන ලද අතිශය, අසාමාන්‍යද සඳහන් කරන්න.

(ලකුණු 3 + 4 + 4 = 11)

07 (i) අල්කුර්ආන්හි විශිෂ්ටත්වයන් දෙකක් සඳහන් කරන්න.

(ii) පාප ක්‍රියාවන්ගෙන් ඇතිවෙන හානීන් තුනක් සඳහන් කරන්න.

(iii) කුඩා දරුවන් කෙරෙහි මුහම්මද් (සල්) තුමා ආදරය කළ ආකාරය සඳහන් කරන්න.

(ලකුණු 3 + 4 + 4 = 11)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | iv | (02) | iii | (03) | iv | (04) | i | (05) | ii | (06) | ✓ | (07) | ✓ | (08) | ✓ |

(09) × (10) × (11) යතීම් (12) කිසිදු වටිනාකමක් නැති දේවල් (13) විශ්වාසවන්තයා

(14) 15 (15) 114 (16) කැඳවීම (17) භංගත්වය (18) ආදරය (19) මහා පාප ක්‍රියාවන්

(20) පාරායන කර දෙන ලද වහි

## II කොටස

(ලකුණු 2 x 20 = 40)

01 (i) ආදරය, ආරක්ෂාව, සෙනෙහස

(ii) කේලම් කීම / රණ්ඩු වීම (සුදුසු පිළිතුරු)

(iii) ණයට දීම / යහ වචන කතාකිරීම (සුදුසු පිළිතුරු)

(iv) මලක්වරුන්ගේ සටහන්, ක්‍රියාවන් කළ ස්ථාන

(v) ආදේශ කිරීම, හූනියම් කිරිම (7 පාපයන්ගෙන් දෙකක්)

(vi) පරලොව දිනයේ නිර්දේශ කිරීම, කුසල් ලැබීම

(vii) පැන්සල්, පෑන් (සුදුසු පිළිතුරු)

(viii) හදීස් කුද්සි - හදිස් නබවි

02 (i) වයෝවෘද්ධයින්, අනාථයින්, වැන්දඹුවන්, අංගවිකල අය, කුඩා දරුවන්

(ii) 1. මොනයම් දෙයක් හෝ අන් අයට ලබාදීම.

2. සමාජ වගකීම් ඉටුකිරීම.

3. සලාතය ආරක්ෂා කිරීම.

4. ක්‍රියාවන් යහපත් චේතනාවින් ඉටුකිරිම.

(iii) දුප්පතුන්, වුවමනාවක් නොමැති අය, අන් අයට පෙන්වීම, සලාතය ඉටුකරන්නන්

03 (i) අල්ලාහ්ගෙන් උපකාර පැතීම / අවශ්‍ය දෑ රැගෙන යෑම / සලාතය ඉටුකර වේලාවන් සැලකිල්ලට ගැනීම

(ii) මානව දයාව කඩකිරිම / සමාජ අයිතිවාසිකම් වළක්වාලිම / සාමාන්‍ය මිනිස් ජීවිතය කඩවීම / කෝලාහල වැඩිවිම

(iii) සත්‍ය, පොරොන්දු ඉටුකිරිම, කීකරුවීම, ඉවසීම

04 (i) ඔවුන්ගේ උපදෙස්වලට සවන්දිම / තර්ක, විතර්ක වලින් වැලකීම / කීකරුවීම

(ii) ප්‍රාර්ථනාව මුඃමින්වරයෙකුසේ ආයුධය වේ.

(iii) බොරුකීම, විහිළු කිරිම. අන් අය සූරාකෑම, රණ්ඩු වීම

05 (i) නබිතුමාණනි ! ඔබ යහපත් ගතිගුණාංග වලින් යුතුව සිටියහුය''

(ii) සලාම් කිම / වාහනයේ ගෙනයෑම / හිස අතගෑම / ගතිගුණාංග කියාදිම

(iii) 1. අල්කුර්ආනය මුළුමනින්ම මුතවාසර් නම් සම්පූර්ණ විශ්වාසනීයයි, හදීස් කුද්සිහි ශ්‍රේණීන් තිබේ.

2. අල්කුර්ආනය පාරායන කිරීම නැමදුමකි. හදීස් කද්සි එසේ නොමැත

06 (i) හදීස් කද්සි යනු අල්ලාහ් පැවසූහ යන වචනයෙන් මුහම්මද් (සල්) තුමාණන් විසින් කියන ලද හදිසයන්

හදීස් නහබි යනු නබි මුහම්මද් (සල්) තුමාගේ වචන, ක්‍රියා, පිළිගැනිම් හා ඔහුගේ ශරීර ලක්ෂණ, ගතිගුණාංග ආදිය පිළිබඳ පාවරණ

(ii) 1. සලාතය ස්වර්ගයේ යතුර වේ.

2. සලාතය ඉටුකරන්නාට මලක්වරු ප්‍රාර්ථනා කරයි.

3. සලාතය බොහෝ කුසල් ලබාදෙයි.

4. උසස් ස්ථානයන් ලබාදෙයි.

(iii) මුසා (අලෛ) - හැරමිටිය සර්පයෙක් විම.

දාවුද් (අලෛ) - යකඩ සිනිඳු විම.

ඊසා (අලෛ) - මළවුන් පණගැන්විම.

මුහම්මද් (සල්) - අල්කුර්ආනය

07 සුදුසු පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න.